www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදය සහ නිදහස් අධ්‍යාපනයේ ආරක්ෂාව

## Socialism and the defense of public education

2009 දෙසැම්බර් 24

ඔබාමා පාලනාධිකාරය එක්සත් ජනපදය තුල නිදහස් අධ්‍යාපනයට එල්ල වන පෙර නොවූ විරූ ප්‍රහාරයක පෙරමුන ගෙන සිටී. වෝල් වීදියට ඩොලර් ට්‍රිලියන ගනනින් සපයා දෙන අතරතුරේ ජනපද හා ප්‍රාන්ත ආන්ඩු වලට අරමුදල් සැපයීම අත්හිටුවා ඇති ඔබාමා, ඒවායේ අහස උසට නගින අයවැය හිඟ පියවා ගැනීම සඳහා රජයේ පාසල් වසා දමන්නටත් අර්ධ-පෞද්ගලික බලපත්‍රලාභී පාසල් විවෘත කරන්නටත් ඒවාට බල කර ඇත.

මිචිගන් සහ අනෙකුත් ප්‍රාන්තවල පාසල් දිස්ත්‍රික්ක, රැකියා දිගට හරහට කපා හරිමින් ද සිසුන් ප්‍රවාහනය වැනි අත්‍යවශ්‍ය සේවා වනසා දමමින් ද සිටී. ගුරුවරුන් නිවාඩු යාම නිසා හවායිහි පාසල් සතිය දින හතරකට අඩු කොට ඇත. මෙම කපා හැරීම් උසස් අධ්‍යාපනය තෙක් ද ව්‍යාප්ත වී ඇති අතර, අධ්‍යාපනය ලබා ගැනීමේ දී උපකාරක පන්තිවලින් (tuition) ලබා ගත යුතු දැනුම් ප්‍රතිශතය සියයට 32 දක්වා වැඩි කල යුතු යැයි පනවමින් කැලිෆෝනියා ප්‍රාන්තය එහි ලා පෙරමුන ගෙන ඇත.

ඔබාමා පරිපාලනය ලබා දී ඇති සොච්චම් ෆෙඩරල් අරමුදල් ප්‍රමානය පවා ලැබෙන්නේ — "ඉහලට නැගීමේ තරගය" ("Race to the Top") නමැති සිය වැඩ සටහන වෙනුවෙන් එය ලබා දී ඇත්තේ එක්සත් ජනපද ඩොලර් බිලියන 4ක් තරම් ස්වල්පයකි — පාසල් දිස්ත්‍රික්ක බලපත්‍රලාභී පාසල්වල ප්‍රසාරනයට පවතින සීමාවන් ඉවත් කරන තරම අනුව සහ පාසල් අරමුදල් සහ ගුරුවරුන්ගේ වැටුප ප්‍රමිතිකරනය කරන ලද පරීක්ෂා කලිතයන්ට බැඳ දමන තරම අනුව ය.

රජයේ පාසල් මුහුන දෙන මෙම මහා ව්‍යසනය වූකලි කම්කරු පන්තියේ සමාජ තත්ත්වයට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කල පොදු ප්‍රහාරයක කොටසක් ලෙස දශක තුනක් තිස්සේ අධ්‍යාපනයට එල්ල කල ප්‍රහාරවල කූට ප්‍රාප්තිය යි. ප්‍රහාරය බැරෑරුම්ව ඇරඹුනේ අධ්‍යාපනයට වෙන් කරන ෆෙඩරල් අරමුදල් පංගුව අඩකින් කපා හැරීමට රේගන් පියවර ගැනීමත් සමග 1980 ගනන්වල දී ය. ක්ලින්ටන් 1990 ගනන්වල දී ක්‍රියාත්මක කල බලපත්‍රලාභී පාසල් සහ "පාසල් වරනය" ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිලිවෙල ද ඩිමොක්‍රැටික සෙනෙට් සභික එඩ්වඩ් කෙනඩිගේ සමඅනුග්‍රාහකත්වයෙන් බුෂ් ක්‍රියාත්මක කල "එක ද දරුවෙකු වත් අත නොහැරීමේ පනත" ද සමගින් එය අඛන්ඩව ඉදිරියට ගියේ ය.

සමාජ පරිහානියේ අවසානයක් දැකීම සඳහා පැවති මහජන මනෝගතියට ආයාචන කරමින් සහ අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපතිවරයෙකු කම්කරු පන්තිය කෙරෙහි වඩා සානුකම්පික වනු ඇති බවට පැවති විශ්වාසය ගසා කමින් තේරී පත් වූ වත්මන් පාලනාධිකාරය රජයේ පාසල්වලට එල්ල කරන වඩා අනුකම්පා විරහිත පවා යැයි කිව හැකි ප්‍රහාරයක වාහකයක් බවට පත්ව තිබීම බොහෝ ගුරුවරුන්ට සහ නිදහස් අධ්‍යාපනයේ ආධාරකරුවන්ට කම්පනයක් ලඟා කර දී ඇතුවාට කිසි ම සැකයක් නැත. කෙසේ වුව ද, අධ්‍යාපනයට එල්ල කරන ප්‍රහාරය වනාහි — යුද්ධය තීව්‍ර කිරීම ද මූල්‍යමය ප්‍රභූව තව දුරටත් පොහොසත් කිරීම ද ඇතුලත් වන — ඔබාමාගේ සමස්ත ප්‍රතිපත්තියේ කොටසකි.

ඔබාමාගේ සහ ඔහුගේ අධ්‍යාපන ලේකම් ආරන් ඩන්කන්ගේ ප්‍රතිපත්තිවලින් නියෝජනය වන්නේ තම සමාජ-ආර්ථික පසුබිම නො තකා නිදහස්, ගුනාත්මක අධ්‍යාපනයක් ලැබීමට සියලු දරුවන්ට අයිතියක් ඇත යන මූලික ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය ප්‍රතික්ෂේප කිරීමකි. පාලනාධිකාරය පෙරමුන ගෙන සිටින්නේ කම්කරු පන්තික තරුනයන්ගෙන් කොටසකට පමනක් අධ්‍යාපනය ලබා දීමට සැලසුම් කල බලපත්‍රලාභී පාසල්වලට ආන්ඩුව සහනාධාර සපයන, විශාල වශයෙන් පෞද්ගලීකරනය කරන ලද පද්ධතියක් බවට අධ්‍යාපනය පරිවර්තනය කිරීමේ ක්‍රියා පිලිවෙතක ය. සෙසු පාසල් ඉගෙනුම් මධ්‍යස්ථානවලට වඩා සිසුන් විෂය කරුනු සටහන් කර ගැනීමෙහි යෙදෙන පාසල් බවට පත් වේ.

ගුනාත්මක අධ්‍යාපනය සියලු දෙනාගේ අයිතියක් නො ව සුලු පිරිසකගේ වරප්‍රසාදයක් බවට වේගයෙන් පත් වෙමින් පවතියි.

එක්සත් ජනපදයේ ප්‍රධාන ම දිළිඳුතම නගරය වන ඩෙට්‍රොයිටය මෙම ප්‍රහාරයේ කේන්ද්‍රයක් බවට පත්ව ඇත. ඔබාමා පාලනාධිකාරය ද ඇමරිකානු ගුරු සම්මේලනය සහ එහි ඩෙට්‍රොයිට් ශාඛාව ද සමග සමීපව වැඩ කරමින් පාසල් දිස්ත්‍රික්කයේ රාජකාරි කරන රාජ්‍යයෙන් පත් කල "හදිසි මූල්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා" මේ දැන් මීලඟ දෙවසර පුරා දිස්ත්‍රික්කයට තමන්ගේ වැටුපෙන් එක්සත් ජනපද ඩොලර් 10,000ක් "නයට දීමට" සෑම ගුරුවරයෙකුට ම බල කෙරෙන ගිවිසුමක් පැනවූවා විතර ය. මෙම ගිවිසුම යටතේ තෝරා ගත් සිසුන් කොටසක් වෙනුවෙන් "ප්‍රමුඛතා පාසල්" පිහිටුවීමත් සමග, "අලාභදායී පාසල්" යැයි කියනු ලබන පාසල් වසා දැමීමත් පලපුරුදු ගුරුවරුන් රැකියාවලින් නෙරපීමත් වේගවත් වන්නට නියමිත ය.

පැරනි සහ නිසි ලෙස නඩත්තු නොකෙරෙන පාසල් ගොඩනැගිලි ද පොත්පත්, පරිගනක, විද්‍යාගාර යනාදි මූලික ඉගෙනුම් උපකරනවල නින්දා සහගත හිඟයක් ද සමග මුසු වී ගත් කලින් පැවති ලෝක මෝටර් රථ නිෂ්පාදනයේ කේන්ද්‍රස්ථානයෙහි පවතින මහා විරැකියාවේ කොන්දේසි තුඩු දී ඇත්තේ පරීක්ෂා කලිතයන් පිරිහී යාමට සහ උපාධිලාභීන්ගේ අනුපාතය වේගයෙන් පහත වැටීමට ය. මෙම ව්‍යසනය ආපසු හැරවීමට උත්සාහ කරනවා වෙනුවට දේශපාලනඥයන් සහ පාසල් පරිපාලකයන් කර ඇත්තේ ගුරුවරුන් බිලි දී රාජ්‍ය පාසල් පද්ධතිය කෙරෙහි පවතින මහජන විශ්වාසය බිඳ දැමීමට අර්බුදය ප්‍රයෝජනයට ගැනීම යි.

මෙය හිතාමතා සැලසුම් කල පන්ති පිලිවෙතකි. අත්‍යධික ලෙස සමෘද්ධිමත් සහ දූෂිත මූල්‍ය කතිපයාධිපත්‍යයක් ආධිපත්‍යය දරන ඇමරිකානු පාලක ප්‍රභූවට, විරැකියාවෙන් හෝ දරිද්‍රතා මට්ටමේ වැටුප්වලින් සුසැදි අනාගතයකට මුහුන පා සිටින කම්කරු පන්තියේ පුලුල් කොටස්වලට අධ්‍යාපනය ලබා දීමට මුදල් ආයෝජනය කිරීමේ කිසිදු අදහසක් නැත.

සමාජයක ස්වාස්ථ්‍යය පිලිබඳ වඩාත් ම තීරනාත්මක මිනුම වන්නේ ඊලඟ පරම්පරාවේ සංස්කෘතික සහ බුද්ධි මට්ටම නගාසිටුවීමේ කර්තව්‍යයට එය නියම කරන වටිනාකම සහ ඒ වෙනුවෙන් එය කැප කරන සම්පත් ප්‍රමානය යි. එක්සත් ජනපදයේ නිදහස් අධ්‍යාපනයේ තත්ත්වය ධනවාදී සමාජය පිලිබඳ දෝෂාරෝපනයකි.

**සමාජ සමානතාව සහ අධ්‍යාපනය**

එක්සත් ජනපදය තුල රජයේ පාසල් පිහිටුවීම වූකලි සමාජ අසමානතාවට සහ පීඩනයට එරෙහිව 18 වන සහ 19 වන සියවස්වල පැන නැගි ප්‍රචන්ඩ විප්ලවීය කැලඹීම්වල නිෂ්පාදිතයකි. දැනුම සහ පුහුනුව අත් කර ගැනීමට අවශ්‍ය කරන මාධ්‍යයන් සැපයුනොත් සාක්ෂාත් කර ගත හැකි සහජ ශක්‍යතාවක් සෑම පුද්ගලයෙකු තුල ම ඇතැයි ඇමරිකානු විප්ලවයේ ශ්‍රේෂ්ඨ නායකයෝ විශ්වාස කලහ. 1779 දී තෝමස් ජෙෆර්සන් "දැනුම වඩා පොදුවේ ව්‍යාප්ත කිරීම" සඳහා වූ පනතක් ඉදිරිපත් කලේ ය. එය නිදහස් රජයේ පාසල් පිහිටුවීමට කැඳවුම් කලේ ය. මෙය "සංවර්ධන මාධ්‍යයන් හිඟකමින් පෙලෙන සියලු රටවල දී දරිද්‍රතාවෙහි ගිලී යටපත්ව තිබෙන සහජ කුසලතා ස්කන්ධය ක්‍රියාකාරී කරනු" ඇතැයි ඔහු පැවසී ය.

ඇමරිකානු විප්ලවවාදීන් විශ්වාස කලේ දුෂ්ට පාලනය සහ පීඩනය වලකා ලිය හැකි එක ම මාධ්‍යය උගත් මහජනතාව පමනක් බව යි. ජෙෆර්සන් පැවසුවේ, නිදහස් පාසල් පද්ධතියක් පිහිටුවීමට කරන රජයේ වියදම, "අප මහජනතාව නූගත්කමට අත හැර දැමුව හොත් අප අතර නැගී සිටින රජවරුන්ට, පූජකයන්ට සහ වංශාධිපතීන්ට ගෙවීමට සිදු වන මුදල් ප්‍රමානයෙන් දහසෙන් පංගුවක් වත් නොවනු" ඇති බව යි.

"පොදු පාසල් සංකල්පයේ පීතෘවරයා" ලෙස හැඳින්වෙන හෝරස් මාන්ගේ, විලෝපනවාදී තාඩියුස් ස්ටීවන්ස්ගේ සහ දර්ශනවාදී ජෝන් ඩෙවිගේ පටන් මුල් කාලීන කම්කරු පන්තික සහ සමාජවාදී නායකයන් සහ සිවිල් අයිතීන් පිලිබඳ ව්‍යාපාරයේ පුරෝගාමීන් දක්වා වූ නිදහස් අධ්‍යාපනය සඳහා සටන්වැදි සටන්කරුවන් ප්‍රේරනය වූයේ සෑම දරුවෙකු ම අධ්‍යාපනය ලැබිය යුතු ය, වහලෙකුව සිටි දරුවෙකු වුවත්, ළමා ශ්‍රමිකයෙකු වුවත්, සංක්‍රමනික කම්කරු පන්තිකයෙකු වුවත් සෑම දරුවෙකුට ම අධ්‍යාපනය ලැබිය හැකි ය, ප්‍රජාතන්ත්‍රවාදයේ අඛන්ඩ පැවැත්ම රඳා පවතින්නේ ඒ මත ය යන්න ගැන වූ ප්‍රගාඪ විශ්වාසයකිනි.

අද දින, ඇමරිකානු සංගත ද දේශපාලන සංස්ථාපිතය ද මෙම සමානාත්මතාවාදී සංකල්පය ප්‍රතික්ෂේප කර ඇත. එහි අදහස අනුව — විශේෂයෙන් ම අභ්‍යන්තර නගරවල වෙසෙන — දසමිලියන සංඛ්‍යාත වූ කම්කරු පන්තික තරුනයන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා කරන වියදම සිය ධන සම්පත් නො ඉවසිය හැකි ලෙස උල්ලංඝනය කිරීමකි. මෙම විශ්ව-ද්වේෂී පන්ති පිලිවෙතට "පෞද්ගලික වගකීම් සහගත භාවය" ඉල්ලා කරන කන්නලව්වල වේශය දෙනු ලැබේ. ධනවතුන්ට සහ බලවන්තයන්ට සිය සේවාවන් කුලියට දීමෙන් තම ජීවිකා වෘත්තිය ද මිලියන සංඛ්‍යාත මුදල් ද උපයා ගෙන ඇති ඔබාමා යලි යලිත් ප්‍රකාශ කර ඇති පරිදි, දරිද්‍රතාව සහ ජරාවට යන පාසල් යනු "අසමර්ථතාවෙන් ගැලවීමට යොදා ගත හැකි නිදහසට කරුනක් නො වේ."

නිදහස් අධ්‍යාපනයට එල්ල වන ප්‍රහාරය ඇමරිකාව තුල සමාජ අසමානතාව වැඩීමේ ප්‍රතිඵලයක් වන අතර, ඒ අනුව එය ඇමරිකානු සහ ලෝක ධනවාදයේ කුනු වීමේ වඩාත් ම දුෂ්ට සහගත ප්‍රකාශනය ද වේ. සමාජයේ ඉහල ම සියයට 1ත් ජනගහනයේ පුලුල් ප්‍රජාවත් අතර පවතින දැවැන්ත සහ වැඩෙන පරතරය ප්‍රජාතන්ත්‍රවාදය සමග නො ගැලපෙයි. නිදහස් අධ්‍යාපනය විනාශ කිරීම යනු එක්සත් ජනපදය තුල ප්‍රජාතන්ත්‍රවාදයේ අවසන් අර්බුදයේ ප්‍රගාඪ ප්‍රකාශනයකි.

සාමාජීය සහ ආර්ථික සාරයෙන් ගත් කල පරපෝෂිත ද සාපරාධී ද වන එක්සත් ජනපද මූල්‍ය ප්‍රභූව ප්‍රධාන පක්ෂ දෙකෙහිත් සෑම දේශපාලනික ආයතනයක මත් ආධිපත්‍යය දරමින් යථා ආඥාදායකත්වයක් පවත්වා ගෙන යයි. එය ඓන්ද්‍රියව ම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට සතුරු ය.

දශක ගනනාවක් තිස්සේ පැවති දේශපාලන ප්‍රතිගාමිත්වයේ බලපෑම, පැරනි කම්කරු ව්‍යාපාරයේ බිඳ වැටීම සහ සමාජවාදී දේශපාලනය සහ චින්තනය අර්ධ වශයෙන් සාපරාධීකරනය වීම නිසා බුද්ධිමය සහ සංස්කෘතික ජීවිතය ආලාපාලු වී ඇත. අතීතයේ විසූ විවේචනශීලී වූත් විරෝධතාවාදී වූත් ලිබරල් බුද්ධිමතුන් සමූහයා වඳ වී ගොස් බොහෝ කල් ය. ප්‍රතිපත්තිය පිලිබඳ මූලික ගැටලුවල දී ඩිමොක්‍රැටික් සහ රිපබ්ලිකන් පක්ෂ සැබවින් ම එකිනෙකින් වෙන් කොට දැක්විය නොහැකි තත්ත්වයකට පත්ව ඇත. ඔබාමා පාලනාධිකාරය බුෂ් පාලනාධිකාරයේ මිලිටරිවාදී සහ සංගත හිතපක්ෂපාතී ප්‍රතිපත්ති අඛන්ඩව පෙරට ගෙන යාම මීට උදාහරන ය.

දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කොටසක් ශිෂ්ට සම්පන්න අධ්‍යාපනයක් සඳහා ඇති අයිතිය ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කිරීමට කැප වී නැත.

වෘත්තීය සමිති කම්කරු පන්තිය දිවි ගෙවන සමාජ කොන්දේසි තුල ගැබ් වන ජීවන ප්‍රමිතීන් විනාශ කිරීමේ දී සංගතවාදී හවුල්කරුවන් බවට පත්ව ඇත. වෘත්තීය සමිතිවල විධායකයන්ගේ වේතන ද අමතර වාසි ද සුරක්ෂිත වෙතැයි බලාපොරොත්තුවෙන්, ඇමරිකානු ගුරු සම්මේලනය සහ ජාතික අධ්‍යාපන සංගමය සංගත ප්‍රභූවේ සහ ආන්ඩුවේ අධ්‍යාපන විරෝධී සහ ගුරු විරෝධී ප්‍රතිපත්තිවලට අත්සන් තබා ඇත.

එක්සත් ජනපදය තුල නිදහස් අධ්‍යාපනයේ අර්බුදය, පවත්නා ආර්ථික සහ දේශපාලන පද්ධතියේ අර්බුදය තුල ගැඹුරින් මුල් බැස ඇත. අධ්‍යාපනය ආරක්ෂා කිරීමේ සටන දේශපාලනික සහ විප්ලවවාදී ප්‍රශ්නයකි.

නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කල හැකි වන්නේ සමාජවාදය සඳහා කරන අරගලයෙන් පමනකි. මින් අදහස් වන්නේ, මූල්‍ය ප්‍රභූවේ දැඩි ග්‍රහනය බිඳ දැමීම සඳහාත් ආර්ථික සහ දේශපාලන ජීවිතයෙහි වැඩ කරන ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පිහිටුවීම සඳහාත් කම්කරු පන්තිය බලමුලු ගැන්වීම යි. නූතන කාලයේ ප්‍රභූ පෙලැන්තියක සුභසිද්ධිය වෙනුවෙන් කොල්ල කනු වෙනුවට පාසල් වැඩි දියුනු කිරීම සඳහා සහ මහජනතාවගේ ආර්ථික සහ සංස්කෘතික මට්ටම නැංවීම සඳහා කම්කරු පන්තිය නිපැයූ ධනය වෙන් කල හැකි සහ දැනට මත් පවතින අපරිමිත තාක්ෂනික සහ මානව සම්පත් ප්‍රයෝජනයට ගත හැකි වන එක ම මග මෙය යි.

නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා වූ ගුරුවරුන්ගේ, සිසුන්ගේ සහ දෙමාපියන්ගේ සටන, ඔබාමා පාලනාධිකාරයට, ඩිමොක්‍රැටිකයන්ට සහ රිපබ්ලිකානුවන්ට ද ඔවුන් ආරක්ෂා කරන ධනවාදී පද්ධතියට ද එරෙහි දේශපාලන අරගලයකි.

ජෙරී වයිට්

© www.wsws.org